# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
## SABARAGAMUWA UNIVERSITY OF SRI LANKA
තැ. පෙ. 02, බෙලිහුල්ඔය - P.O. Box 02, Belihuloya, Sri Lanka
දුර Tele: 045-2280087 / 2280014 / 2280033 - ෆැක්ස් Fax: 045 – 2280033/ 2280015/ 2280128


සියළුම උපාධිලාභීන් වෙත

## 22 වන උපාධි ප්‍රදානෝත්සවයේ තුන්වන අදියර - 2022 ජනවාරි මස 07

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධිලාභී ඔබට විශ්වවිද්‍යාලය වෙනුවෙන් සුභාශිංසන පිරිනමමි.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විසි දෙවන උපාධි ප්‍රදානෝත්සවය **2022 ජනවාරි මස 07 වන දින පෙරවරු 9.00 ට හා පෙරවරු 11.30 ට** සැසි දෙකක් ලෙස කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මහචාර්ය ජේ.ඩබ්. දයානන්ද සෝමසුන්දර ශ්‍රවණාගාරයේ දි පවත්වනු ලැබේ. එහි දී **පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කළමනාකරණ අධ්‍යයන පීඨය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, භූ විඥාපන පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය සහ කෘෂි විද්‍යා පීඨය යන පීඨවල** උපාධිලාභීන්ට උපාධි පිරිනමනු ලැබේ.

### 1. ලියාපදිංචි වීම, ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සහ උපාධි ලෝගු නිකුත් කිරීම

උත්සවය සඳහා ලියාපදිංචි වීම, ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සහ උපාධි ලෝගු නිකුත් කිරීම **2021 දෙසැම්බර් මස 11 සහ 12 යන දිනයන්හි අදාළ කණ්ඩායමට අයත් සිසුන් පමණක් තමාට හිමි වේලාවේදී** විභාග අංශයට පැමිණ ලියාපදිංචි වීමෙන් ප්‍රවේශ පත්‍රය ලබාගෙන විශ්වවිද්‍යාලයීය ප්‍රධාන ගබඩාවෙන් උපාධි ලෝගුව ලබාගන්නා ලෙස දැනුම් දෙනු ලැබේ.

**ඒ සඳහා ශිෂ්‍ය හැඳුනුම්පත හෝ ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කළ යුතුය. ඔබ වෙනුවෙන් වෙනත් පුද්ගලයෙකුට ලියාපදිංචි වීමට හෝ උපාධි ලෝගුව නිකුත් කිරීම සිදු කරනු නොලැබේ.**

### 2. උපාධි ලෝගු හා මාලය ආපසු භාරදීම

ඔබ ලබා ගන්නා උපාධි ලෝගු විශ්වවිද්‍යාලයීය ප්‍රධාන ගබඩාවටත් උපාධි ප්‍රදානෝත්සවයේ දී පළඳවනු ලබන මාළය (Garland) විභාග අංශයටත් **2022 පෙබරවාරි මස 25 වන දිනට පෙර** ආපසු බාර දිය යුතුය. 2022 **පෙබරවාරි** මස 25 වන දිනට පසුව ප්‍රමාද වන සෑම දිනයක් සඳහා ම රු. 50.00ක දඩ මුදලක් අය කරනු ලැබේ.

උපාධි ලෝගුව හා මාළය නැවත බාර දෙන තුරු ඔබගේ උපාධි සහතිකය නිකුත් නොකරන බව කරුණාවෙන් සළකන්න. සහතික පත්‍රය නිකුත් කරනු ලබන්නේ උපාධිලාභීන්ට **පමණි**. ඔහුට හෝ ඇයට තමා වෙනුවට වෙනත් අයෙකු ඉදිරිපත් කර සහතිකය ලබාදීම සිදුකරනු නොලැබේ.

### 3. ඇඳුම

සියළුම කාන්තා උපාධිලාභීන් සුදුසු වර්ණයක සාරියකින් / ඔසරියකින් සැරසී සිටිය යුතු අතර, පිරිමි උපාධිලාභීන් යුරෝපීය ඇඳුමෙන් හෝ ජාතික ඇඳුමෙන් සැරසී සිටිය යුතුය.

### 4. ජායාරූප ගැනීම

උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ ජායාරූප ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් බලය පවරා ඇති ජායාරූප ශිල්පියා ලවා උත්සව අවස්ථාවේ දි 8" x 10" ප්‍රමාණයේ ජායාරූපයක් සහ උපාධි ප්‍රදානෝත්සවය අඩංගු විඩියෝ තැටියක් (DVD) ලබා දීමට කටයුතු කර ඇත.

පෞද්ගලික කැමරා, ජංගම දුරකථන හා වෙනත් කිසිදු පාර්සලයක් හෝ ගමන් මල්ලක් උත්සව ශාලාව තුළට ගෙන යාමට අවසර නොදෙන බව විශේෂයෙන් සැලකිය යුතු ය.

### 5. උපාධිලාභී පෙරහැර

ඔබ උපාධිලාභීන්ගේ පෙරහැරට ඇතුළත් වන බැවින් එකී පෙරහැරට සූදානම් වීම පිණිස පළමු සැසිය සඳහා **පෙ.ව. 08.00 ට පෙර ද දෙවන සැසිය සඳහා පෙ.ව. 10.30 ට පෙර ද භූ විඥාපන පීඨ පරිශ්‍රය** අසලට පැමිණීම ඉතා වැදගත් බව සලකන්න. ඔබ ලියාපදිංචි වන අවස්ථාවේ දී උපාධිලාභීන්ගේ පෙරහැරේ ඔබ ගමන් කළ යුතු ස්ථානයේ අනු අංකය ලබා දෙනු ලබන අතර එම අංකය ලෝගුවේ පැළඳ සිටිය යුතුය. තවද ඔබට නිකුත් කරන ප්‍රවේශපත්‍රයෙහි ඔබ සහභාගි විය යුතු සැසිය, සහභාගි විය යුතු දිනය සහ වේලාව සටහන් කර ඇත.

**(ප්‍රවේශපත්‍රයෙහි ඔබ සහභාගි විය යුතු සැසිය , දිනය සහ වේලාව සටහන් කර ඇතිදැයි පරීක්ෂා කර බලන්න.)**

## 6. ඉතා වැදගත්

උත්සව ශාලාවට ප්‍රවේශ වීමේ දී ඔබගේ විශ්වවිද්‍යාලයීය හැඳුනුම්පත හා ඔබට නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ද රැගෙන ආ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ඔබගේ අමුත්තන් ද ජාතික හැඳුනුම්පත් සහ ප්‍රවේශපත් රැගෙන ආ යුතුය. උපාධි ප්‍රදානෝත්සව ශාලාව තුළට කුඩා ළමුන් හා කැමරා, ජංගම දුරකථන රැගෙන යාමට අවසර දෙනු නොලැබේ.

## 7. සහතික පත්‍රයට ඇතුලත් කිරීම සඳහා වූ ඡායාරූපය

ලියාපදිංචි වන දින, සියළුම උපාධිලාභීන් 3.5cm x 3.5 cm ප්‍රමාණයේ උඩුකය කළු සුදු ඡායාරූප දෙකක් පිටුපසෙහි තම නම සහ ලියාපදිංචි අංකය සඳහන් කර විභාග අංශය වෙත භාර දිය යුතු වේ. (ඡායාරූපයන්හි සියළුම කාන්තා උපාධිලාභීන් සාරියකින්/ ඔසරියකින් සැරසී සිටිය යුතු අතර, පිරිමි උපාධිලාභීන් යුරෝපීය ඇඳුමෙන් හෝ ජාතික ඇඳුමෙන් සැරසී සිටිය යුතුය. එසේ නොවන ඡායාරූප බාර ගනු නොලැබේ.)

## 8. ආචාරශීලී බව

උපාධි ප්‍රදානෝත්සව ශාලාවේදී උපාධිලාභීන්ගේ නම් අනුපිළිවෙලට කියවනු ලැබේ. (උපාධි ප්‍රදානෝත්සව ශාලාවේදී ඔබ වෙත ලබාදෙන නාම ලේඛනය ඇතුළත් පොත අනුව) ඔබගේ නම කියවීමට පෙර අසුනින් නැගිට වේදිකාවට නැගීමට ඇති පියගැටපෙළ අසල පේළි ගැසී සිටිය යුතුය. ඔබගේ නම කියවුණු විට ඉතා සංවර ලීලාවෙන්, විනීතව කුලපති ස්වාමීන්වහන්සේ ඉදිරියට ගොස් උපාධිය ප්‍රදානයෙන් පසු හිසනමා වැඳ ආචාර කොට ආපසු පැමිණ ඔබට නියමිත අසුනේ වාඩි විය යුතුය.

## 9. COVID -19 සඳහා අදාල සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම

ඔබ හා ඔබගේ අමුත්තන් විශ්විද්‍යාලය තුල දී COVID -19 සඳහා අදාළ රජය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ අනිවාර්යයෙන්ම අනුගමනය කල යුතු අතර COVID -19 සඳහා එන්නත් කළ කාඩ් පතේ පිටපතක් ලියාපදිංචි වන දිනයේදී ලබාදිය යුතුය. එසේම මෙම එන්නත් කාඩ් පත උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වන විට, ඔබ හා ඔබගේ අමුත්තන් විසින් රැගෙන ආයුතු අතර අවශ්‍ය විට අදාල අංශ වෙත ඉදිරිපත් කල යුතුය.

❖ **උපාධි ප්‍රදානෝත්සවයට පෙර පහත සබැඳියෙන් (link) යොමු වී ඔබ වෙත ලබා දෙනු ලබන ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කරන්න.**

Questionnaire Link: http://employability-study.sociologicalnotes.com/index.php
User Login : Use Your Index Number without spaces and special characters (Ex : EG001)
User Password : Use Your National Identity Card Number with Capital Letter (Ex : 950245785V)

උපාධි ප්‍රදානෝත්සවයෙන් පසු ප්‍රධාන ශාලාව පිටත සූදානම් කර ඇති තේ පැන් සංග්‍රහයට ඔබගේ අමුත්තන් ද සමඟ සහභාගි වන මෙන් ආරාධනා කර සිටිමි.

උපාධි ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ සම්පූර්ණ සහයෝගය අපේක්ෂා කෙරේ.

මෙයට විශ්වාසී

ඩබ්.එම්.කේ. උපුල්දෙණිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / විභාග
ලේඛකාධිකාරී වෙනුවට
2021.12.09

පිටපත්-
1. උපකුලපති - දැ.ගැ.ස.
2. සියලුම පීඨාධිපතිවරුන් - දැ.ගැ.ස.
2. ලේඛකාධිකාරී - දැ.ගැ.ස.
3. වැඩ බලන මූල්‍යාධිකාරී - දැ.ගැ.ස. / අ.ක.ස.
4. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) - දැ.ගැ.ස. / අ.ක.ස.
5. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / සැපයුම් - දැ.ගැ.ස. / අ.ක.ස.
6. ප්‍රධාන ආරක්ෂක නිලධාරී - දැ.ගැ.ස.
7. මහජන සෞඛ්‍ය නිලධාරී - දැ.ගැ.ස.
8. ගබඩා භාරකරු - දැ.ගැ.ස. / අ.ක.ස.